// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1708/17 - 2011 ජුනි මස 01 වැනි බදාදා - 2011.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත

2011 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු 2011 ජුනි මස 01 වැනි දින ආරම්භ කර ඇති බව 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. දැනට වලංගුව පවතින ඡන්දහිමි නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය කාර්යාලවල දී සහ පහත දැක්වෙන කාර්යාලවල දී ප්‍රදර්ශනය කරවනු ඇත.

| *නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල* | *ප්‍රදර්ශනය කරනු ලබන නාමලේඛන හෝ ඒවායේ කොටස්* |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය (කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා බල ප්‍රදේශ) අංක 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය | කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා බල ප්‍රදේශවල පදිංචිව සිටින සියළුම ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස්, |
| කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, අංක 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය | කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා බල ප්‍රදේශය හැර ඉතිරි ප්‍රදේශවල පදිංචිව සිටින සියළුම ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස්, |
| එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත, |
| එක් එක් ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින ඡන්දහිමියන්ගේ නම් අඩංගු ඡන්දහිමි නාමලේඛන කොටස, |
| එක් එක් පළාත් පාලන ආයතනය | එක් එක් පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින සියළුම ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දිහිමි නාමලේඛන කොටස, |
| එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ සිටින සියළුම ඡන්දහිමියන්ගේ නම් අඩංගු ඡන්දහිමි නාමලේඛන කොටස. |

03. යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්දිහිමියෙකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තෙකුටම සිය නම ඡන්දහිමි නාමලේඛනයේ තිබේදැයි පරීක්ෂා කර බලා නිසැක විය හැකිය.

04. 2011 වර්ෂය වෙනුවෙන් ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගේ විස්තර ලබා ගැනීම සඳහා ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරීන් විසින් ගෘහ මූලිකයන් වෙත අදාළ ආකෘති පත් 2011.06.01 වැනි දින සිට නිකුත් කරනු ලැබේ. එම ආකෘති පත්‍ර මාර්ගයෙන් සිය ගෘහ යටතේ ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන සියළු දෙනාට අදාළ නිවැරදි විස්තර අප්‍රමාදව සපයා දීමෙන් ගෘහ මූලිකයන්, ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරීන්ට සහායවීම අවශ්‍ය වේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2011 ජුනි මස 01 වැනි දින,
මැතිවරණ කොමසාරිස් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

06-132

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.